රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/05/01/06/02/09

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022.06. 29

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**බංගලා භාරකරු හා සහායක බංගලා භාරකරු තනතුරුවල නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම**

'බංගලා භාරකරුවන් සහ සහායක බංගලා භාරකරුවන් සඳහා ස්ථානමාරු පටිපාටිය' යන මැයෙන් ඔබ ඇමතූ මගේ අංක HA/05/01/06/02/08 හා 2021.12.15 දිනැති ලිපිය හා බැඳේ.

02) ඒ අනුව, මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අයත් සංචාරක බංගලාවල බංගලා භාරකරු හා සහායක බංගලා භාරකරු තනතුරුවල සේවය කරන නිලධාරීන් සඳහා අනුමත කරන ලද ස්ථාන මාරු පටිපාටිය එම ලිපිය මගින් යොමුකරන ලද අතර ස්ථාන මාරු ඉල්ලීම් කිරීමට සුදුසුකම් සපුරා ඇති සියළුම නිලධාරීන්ගේ අයදුම්පත් 2022/01/07 දිනට පෙර අමාත්‍යාංශය වෙත යොමුකරන ලෙස දන්වන ලදී .

03) ඒ අනුව අමාත්‍යාංශය වෙත යොමුකරන ලද අයදුම්පත් සම්බන්ධයෙන් ස්ථාන මාරු කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ අනුව, වසර කිහිපයක සිට සංචාරක බංගලාවල වෙන්කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කෝවිඩ් වසංගත තත්ත්වයෙන් බලපෑම් ඇතිවීම, මේ වනවිට 2022 වර්ෂයේ මාස කිහිපයක් ගතවී පැවතීම හා ස්ථාන මාරු අයදුම් නොකරන ලද නිලධාරීන් සංඛ්‍යාව වැඩි පිරිසක් වීම යන කරුණු මත අනුමත ස්ථානමාරු පටිපාටියේ විධිවිධාන පරිදි 2023 වර්ෂයට අදාල ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම සුදුසු බව දක්වා ඇත.

04) ඒ අනුව ස්ථාන මාරු පටිපාටියේ 2.2 වගන්තිය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති සියලු නිලධාරීන්ගේ අයදුම්පත් 2022.07.15 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත යොමුකරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර අදාල සුදුසුකම් සපුරා ඇති සියලු නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත්වන බවට එම නිලධාරීන් දැනුම්වත් කරන ලෙසද තවදුරටත් දන්වා සිටිමි.

පී.එස්.පී. අබේවර්ධන
අතිරේක ලේකම් (පාලන)
ලේකම් වෙනුවට

පිටපත

01) සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) : 2023 වර්ෂය සඳහා බංගලා භාරකරු හා සහායක බංගලා භාරකරු තනතුරුවල සේවය කරන නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් යොමුකරන ලෙස අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පළකිරීම සඳහා

02) බංගලා භාරකරු/සහායක බංගලා භාරකරු, ................................. සංචාරක බංගලාව : දැ.ගැ.පි. හා අ.ක.ස.